ලක්බිම



## පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන්

# ද්විත්ව පුරවැසිභාවය ඇත්තේ ගීතාට පමණයි

ගයාත්‍රි ගීගනආරච්චි

**පාර්ලිමේන්තු** මන්ත්‍රීන් අතරින් ද්විත්ව පුරවැසිභාවය ඇත්තේ ගීතා කුමාරසිංහ මහත්මියට පමණක් යැයි ආගමන විගමන පාලකවරයා විසින් තහවුරු කර ඇතැයි පැෆරල් සංවිධානය පවසයි.

ඒ අනුව අනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 224 දෙනා සඳහා ද්විත්ව පුරවැසි සහතිකයන් නිකුත් කොට නොමැති බව සනාථ වන බවත් ආගමන විගමන පාලකවරයා පැෆරල් සංවිධානයට දැනුම්දී ඇත.

ද්විත්ව පුරවැසිභාවය සහිත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කවුරුන්ද යන්න විමසමින් පැෆරල් සංවිධානය ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත තොරතුරු දැනගැනීමේ පනත යටතේ අයැදුම්පතක් යොමු කර ඇති අතර ඒ අනුව මෙම තොරතුර දැනුම්දී තිබේ.

ඊට ප්‍රතිචාර දක්වමින් ආගමන විගමන පාලකවරයා විසින් සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම්, උපන්දිනයන් හා ජාතික හැඳුනුම්පත් අංකයන් සහිත නාමලේඛනයක් ගෙන්වාගෙන පරීක්ෂාවට ලක්කර ඇතැයි පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා කීය.

එම ලේඛනයේ තොරතුරු හා ද්විත්ව පුරවැසිභාවය ලබාගත් අයගේ තොරතුරු සන්සන්දනය කරමින් ආගමන විගමන පාලකවරයා මෙම තත්ත්වය පරීක්ෂා කර ඇති බවද ඒ මහතා පැවැසීය.